# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 14 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 11 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 13 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1992 අංක 14 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 86/90

**1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 14 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ප්‍රධාන නාමය.

2. 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1958 අංක 15 දරන පනතේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (ඉ) ඡේදයෙහි "සේවා නියුක්තියක් භාරගත් පසු" යන වචන වෙනුවට "සේවා නියුක්තියක් භාරගත් පසු;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඊ) (i) 1987 අංක 22 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද සංස්ථාගත කිරීමේ නියමයක් මගින්, යම් ව්‍යාපාර ආයතනයක් බාර ගැනීමේ සහ කරගෙන යාමේ කාර්ය සඳහා, රාජ්‍ය සංස්ථාවක් පිහිටුවන ලද විට, ඒ සාමාජිකයා එම ව්‍යාපාර ආයතනයේ සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු ඒ සාමාජිකයා එසේ පිහිටුවන ලද රාජ්‍ය සංස්ථාවේ සේවා නියුක්තිය භාර නොගැනීමෙන් පසු ;

(ii) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සංස්ථාවක කාර්තව්‍ය බාරගැනීම සඳහා හෝ ව්‍යාපාර ආයතනයක් බාරගැනීම හා කර ගෙන යාම සඳහා පොදු සමාගමක් සංස්ථාගත කරන ලද විට, අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයා එම රාජ්‍ය සංස්ථාවේ හෝ ව්‍යාපාර ආයතනයේ සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු සහ ඒ සාමාජිකයා එසේ සංස්ථාගත කරන ලද පොදු සමාගමේ සේවා නියුක්තිය භාර නොගැනීමෙන් පසු ;

(iii) සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා ඒ සාමාජිකයා ඉවත් කරන ලද විට, ඒ සාමාජිකයා රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු ;

(iv) යම් රාජ්‍ය සංස්ථාවක් විසුරුවා හැරීමෙන් පසු හෝ යම් රාජ්‍ය සංස්ථාවක් ව්‍යාපාර ආයතනය වසා දැමීමෙන් පසු ඒ සාමාජිකයා ඒ රාජ්‍ය සංස්ථාවේ සේවයේ නියුක්තව සිටීම අවසන් වූ පසු. ".

(3) එහි අවසාන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" මේ වගන්තියෙහි—

(i) " ව්‍යාපාර ආයතනය " යන්නෙන් 1971 අංක 35 දරන ව්‍යාපාර ආයතන (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්කර ගත් හෝ ආණ්ඩුව වෙත සතු වූ යම් ව්‍යාපාර ආයතනයක් අදහස් වේ ;

(ii) " රාජ්‍ය සංස්ථා " යන්නෙහි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

(iii) " ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයා " යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද වෛද්‍ය වෘත්තිකයෙක් අදහස් වේ ;

(iv) " සේවක සංඛ්‍යාව අඩු කිරීම " යන්නෙහි කාර්මික ආරාවුල් පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය. ".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.